**ආදර්ශ ප්‍රශ්න පත්‍රයකි**

**බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

**බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව**

ශ්‍රී බු.ව. 2566 - දහම් පාසල් ශ්‍රේණි විභාගය - 2022

**06 - ශ්‍රේණිය** විභාග අංකය:

**කාලය :- පැය 1 1/2**

---

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විතය. පළමුවන (i) කොටසේ ප්‍රශ්න සියල්ලටත්, දෙවන (ii) කොටසින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් තුන්වන (iii) කොටසේ ප්‍රශ්න දෙකටත් අනිවාර්යයෙන්ම පිළිතුරු සපයන්න.

පළමුවන (i) කොටස සඳහා ලකුණු (2 × 20) 40කි. දෙවන (ii) කොටස සඳහා ලකුණු (20× 02) 40 කි.

තුන්වන (iii) කොටස සඳහා ලකුණු (20× 02) 20කි.

**i කොටස**

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01 සරීකාර තෙමේ අග්‍ර දායකයා හා අග්‍ර උපස්ථායකයා වූයේ

(i) දීපංකර බුදුරජාණන් වහන්සේටය. (ii) කාශ්‍යප බුදුරජාණන් වහන්සේටය.

(iii) කකුසඳ බුදුරජාණන් වහන්සේටය. (iv) කෝණාගම බුදුරජාණන් වහන්සේටය.

02. බුදුරජාණන් වහන්සේ අජපල් නුගරුක මුල ගතකළේ කී වෙනි සතියද?

(i) පස්වන සතියයි. (ii) හතරවෙන සතියයි.

(iii) හයවන සතියයි. (iv) හත්වන සතියයි.

03. "අහසින් වැටෙන එක දිය බිඳක්වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට ගලා යාමට ඉඩ නොදිය යුතුය" යන ප්‍රකාශය කළේ

(i) හයවන පරාක්‍රමබාහු රජතුමා (ii) දෙවන පරාක්‍රමබාහු රජතුමා

iii) හත්වන පරාක්‍රමබාහු රජතුමා (iv) මහා පරාක්‍රමබාහු රජතුමා

04. "තමාගේ සැප පතන කිසිවෙකුත් අනුනට හිංසා නොකරයි" යන අදහස ප්‍රකාශ වන ධම්මපද ගාථාවේ මුල් පදය වන්නේ

(i) නහි වේරේන වේරානී (ii) සබ්බේ තසන්ති දණ්ඩස්ස

(iii) සුඛ කාමානි භූතානි (iv) අත්තාහි අත්තනො නාථෝ

05. කුලතුංග බණ්ඩාරයෝ සුරියගොඩ විහාරයේදී පැවිදි වූ පසුව හැඳින්වූයේ

(i) අඹගහපිටියේ ඤාණවිමල හිමි යන නමිනි (ii) වැලිවිට සරණංකර හිමි යන නමිනි

(iii) තොටගමුවේ රාහුල හිමි යන නමිනි (iv) අඹගහවත්තේ ඉන්ද්‍රසභවර හිමි යන නමිනි

06. සතර අගති ලෙස හඳුන්වන්නේ

(i) ඡන්ද, විරිය, චිත්ත, විමංසා යන හතරයි.

(ii) අර්ථ, ධර්ම, නිරුත්ති, පටිභාන යන හතරයි.

(iii) ඡන්ද, ද්වේෂ, භය, මෝහ යන හතරයි

(iv) දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාව යන හතරයි

07. මහනුවර රාජධානී සමයේදී සිව් මහා දේවාල පෙරහරක් පැවැත්වූ බව ඉතිහාසයේ සඳහන්ය. මෙම පෙරහරට අයත් සිව් මහා දේවාල වන්නේ

(i) නාථ, විෂ්ණු, කතරගම, පත්තිනි යන දේවාල හතරයි.

(ii) විෂ්ණු, කතරගම, සමන්, විභීෂණ යන දේවාල හතරයි .

(iii) නාථ, සමන්, දැඩිමුණ්ඩ, විෂ්ණු යන දේවාල හතරයි.

(iv) පත්තිනි, නාථ, විභීෂණ, සමන් යන දේවාල හතරයි.

08. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනය හඳුන්වන නම කුමක්ද?

(i) ආදිත්ත පරියාය සූත්‍රය

(ii) මහා තණ්හා සංඛය සූත්‍රය

(iii) ධම්ම චක්ක පවත්වන සූත්‍රය

(iv) අනන්ත ලක්ඛණ සූත්‍රය

09. තමා තමන්ටම අවංක වීමේ ගුණය කරණීය මෙත්ත සූත්‍රයේ දක්වා ඇත්තේ

(i) සූජු යනුවෙනි.

(ii) උජු යනුවෙනි.

(iii) සක්කෝ යනුවෙනි.

(iv) සුවචෝ යනුවෙනි.

10. විනයධාරීන් අතරින් අග තනතුරට පත්වූ මහා රහතන් වහන්සේගේ නම කුමක්ද?

(i) සැරියුත් මහ රහතන් වහන්සේ

(ii) අනුරුද්ධ මහ රහතන් වහන්සේ

(iii) උපාලි මහ රහතන් වහන්සේ

(iv) කොණ්ඩඤ්ඤ මහ රහතන් වහන්සේ

11. "උඩගු නොව මහණ" යන වැකිය තල්පතක තෙවරක් ලියා තමා වාසය කරන කුටියෙහි එල්ලා තැබූ ශ්‍රේෂ්ඨ සංඝ පිතෘවරයාගේ නම කුමක්ද?

(i) පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි

(ii) පූජ්‍ය වැලිවිට ශ්‍රී සරණංකර හිමි

(iii) පූජ්‍ය වාරියපොළ ශ්‍රී සුමංගල හිමි

(iv) පූජ්‍ය තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

12. පද්‍ය 238 කින් යුත් ලෝකෝපකාරය නම්වූ උපදේශාත්මක කාව්‍ය ග්‍රන්ථය රචනා කරන ලද්දේ

(i) තොටගමුවේ මාහිමියන් විසිනි.

(ii) වීදාගම මාහිමියන් විසිනි.

(iii) රණස්ගල්ලේ මාහිමියන් විසිනි.

(iv) වැත්තෑවේ මාහිමියන් විසිනි .

13. කැති නැකත මුල් කරගෙන දරමිටි පෝය නමින් හැඳින්වෙන වාර්ෂික මංගල්‍යය සිදු කරන්නේ

(i) ජය ශ්‍රී මහා බෝධි මළුවේය.

(ii) ශ්‍රී දළදා මන්දිරය අසලය.

(iii) රුවන්වැලි මහා සෑ මළුවේය.

(iv) ශ්‍රී පාදස්ථානයේ මළුවේය.

14. සෝවාන් ඵලයට පත් පස්වග තවුසන් රහත් භාවයට පත්වූයේ

(i) ආදිත්ත පරියාය සූත්‍රය ඇසීමෙනි. (ii) සමචිත්ත පරියාය සූත්‍රය ඇසීමෙනි.

(iii) අනන්ත ලක්ඛණ සූත්‍රය ඇසීමෙනි. (iv) මහා තණ්හා සංඛය සූත්‍රය ඇසීමෙනි.

15. බුද්ධරත්නය හා ධම්මරත්නය යන දෙරුවන් සරණ ගිය පළමු උපාසකවරුන් දෙදෙනා වන්නේ

(i) බිම්බිසාර සහ අජාසත්ත යන රජවරුන් දෙදෙනාය. (ii) උපතිස්ස සහ කෝලිත යන යහළුවන් දෙදෙනාය.

(iii) තපස්සු හා භල්ලුක යන සහෝදරයන් දෙදෙනාය. (iv) සුනීධ හා වස්සකාර යන ඇමැතිවරුන් දෙදෙනාය.

16. "ලෝකේ උත්සාහවන්තානං ජනානං කිමසාධියං " මෙම ප්‍රකාශය සිදු කළ රජතුමාගේ නම කුමක්ද?

(i) මහා විජයබාහු රජතුමා (ii) මහා පරාක්‍රමබාහු රජතුමා.

(iii) දුටුගැමුණු රජතුමා (iv) නිශ්ශංකමල්ල රජතුමා

17. සම්මා සම්බුද්ධ නම් බුදු ගුණයට අයත් ගුණාංගයක් වන්නේ

(i) සියලු කෙලෙසුන් කෙරෙන් දුරුවීම නම් ගුණාංගයයි.

(ii) දතයුතු සියල්ල මැනවින් අවබෝධ කර ගැනීම නම් ගුණාංගයයි.

(iii) රහසින් වත් පව් නොකිරීම නම් ගුණාංගයයි.

(iv) සියලු පූජාවන් පිළිගැනීමට සුදුසුවීම නම් ගුණාංගයයි.

18. ලක්දිව අමරපුර නිකාය පිහිටුවීමට මුලික වූ නාහිමිපාණන් වහන්සේගේ නම කුමක්ද?

(i) අඹගහවත්තේ ඉන්දසභවර ඤාණසාමි මාහිමි (ii) වැලිවිට ශ්‍රී සරණංකර මාහිමි

(iii) බෝවල ශ්‍රී ධම්මානන්ද මාහිමි. (iv) අඹගහපිටියේ ඤාණවිමල තිස්ස මාහිමි

19. සිංහල ධම්ම සංගණී නම් බණ පොත රචනා කරන ලද්දේ

(i) මහා පරාක්‍රමබාහු රජතුමා විසිනි. (ii) සයවන පරාක්‍රමබාහු රජතුමා විසිනි.

(iii) මහා විජයබාහු රජතුමා විසිනි. (iv) හතරවන බුවනෙකබාහු රජතුමා විසිනි.

20. වැලිවිට සරණංකර මාහිමියන් විසින් සත්ථා නම් බුදුගුණය විස්තර කරමින් රචනා කල ග්‍රන්ථය හඳුන් වන්නේ

(i) මුනිගුණාලංකාරය යන නමිනි. (ii) සාරාර්ථ සංග්‍රහය යන නමිනි.

(iii) සද්ධම්මෝපායනය යන නමිනි (iv) සද්ධර්මාලංකාරය යන නමිනි.

(ලකුණු 2X20)

## ii - කොටස

මෙම කොටසට ප්‍රශ්න තුනක් ඇතුළත් ය. එයින් තෝරාගත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

01. (i) දෙමව්පියන්ට සිදු කරන නිවැරදි උපකාරය(සැලකීම) වන්නේ ඔවුන් තුළ ගුණාංග 04 ක් වැඩිදියුණු කර ගැනීමට උපකාර කිරීම බව බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. එම ගුණාංග 04 නම් කරන්න. (ලකුණු 1X4)

(ii) දෙමාපියන් තුළ ශ්‍රද්ධාව නම් වූ ගුණාංගය වර්ධනය කිරීම සඳහා දහම් පාසල් දරුවෙකු ලෙස ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග 06ක් ලියන්න. (ලකුණු 1X6)

(iii) දහම් පාසල් දරුවෙකු ලෙස ඔබ නිරතුරු දෙමව්පියන්ට සහ ගුරුවරුන්ට උපකාර කිරීමට යොමු වන අයෙකි. එසේ දෙමව්පියන්ට උපකාර ලෙස කළ හැකි ක්‍රියා 05ක් සහ ගුරුවරුන්ට උපකාර ලෙස කළ හැකි ක්‍රියා 05ක් වෙන් වෙන් වශයෙන් දක්වන්න. (ලකුණු 1X5 +1X5)

02. (i) පුද්ගලයෙකුට සතර ඉරියව්වෙන්ම මෛත්‍රී භාවනාව සිදු කළ හැකිය. මෙම සතර ඉරියව් නම් කරන්න. (ලකුණු 1X4)

(ii) මෛත්‍රී වඩන තැනැත්තාට ලැබෙන ආනිසංස 11 ක් මෙත්තානිසංස සූත්‍රයේ සඳහන්ය. ඉන් 06 ක් ලියා දක්වන්න. (ලකුණු 1X6)

(iii) දහම් පාසල් දරුවෙක් වන ඔබ සැමදෙනා සමගම මිතුරුව වාසය කළ යුතුය. එසේ මිතුරුව වාසය කිරීම නිසා ඔබට ලැබෙන යහපත් ප්‍රතිඵල 5ක් සහ එමගින් අන් අයට ලැබෙන යහපත් ප්‍රතිඵල 5ක් වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න. (ලකුණු 1X5+1X5)

03. (i) විනය පිටකයට අයත් පාරාජිකා පාලි නම් ග්‍රන්ථයේ මල්දම් සකස් කළ ආකාර 6ක් දක්වයි. එයින් 4ක් ලියා දක්වන්න. (ලකුණු 1X4)

(ii) මල් වර්ග, පලතුරු වර්ග, ඖෂධ වර්ග අපට ගෙවත්තේ වගා කර ගත හැකිය. එවැනි දේ වගා කිරීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන 8ක් " පැලයක් සිටුවා ඵලයක් ලබමු" පාඩමේ සඳහන්ය. එයින් ප්‍රයෝජන 6ක් ලියන්න. (ලකුණු 1X6)

(iii) සියතින් වගා කළ මල්, පලතුරු, ඖෂධ පූජා කිරීමෙන් ආනිසංස රාශියක් ලබා ගත හැකිය.එයින් 10ක් ලියා දක්වන්න. (ලකුණු 1X10)

## iii - කොටස

මෙම කොටසේ ප්‍රශ්න දෙකක් ඇතුළත්ව ඇත. එම සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. (i) "පූජේමි බුද්ධං කුසුමේනනේන" මෙම ගාථාව නිවැරදි අක්ෂර වින්‍යාසය සහිතව සම්පූර්ණ කරන්න. (ලකුණු 5)

(ii) එම ගාථාවේ අර්ථය සරල සිංහල භාෂාවෙන් ලියන්න. (ලකුණු 5)

(ලකුණු 5+5=10)

02. (i) "යෝච පුබ්බේ මජ්ජිත්වා " යන ගාථාවේ ඉතිරි පද නිවැරදි අක්ෂර වින්‍යාසය සහිතව සම්පූර්ණ කරන්න. (ලකුණු 5)

(ii) එම ගාථාවේ අර්ථය සරල සිංහල භාෂාවෙන් ලියන්න. (ලකුණු 5)

(ලකුණු 5+5=10)

**ආදර්ශ ප්‍රශ්න පත්‍රයේ පිළිතුරු පත්‍රය**

**බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

**බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව**

ශ්‍රී බු.ව. 2566 - දහම් පාසල් ශ්‍රේණි විභාගය - 2022

06 ශ්‍රේණිය

---

ලකුණු ලබා දීමේ පටිපාටිය

I කොටස

1. බහුවරණ ප්‍රශ්න 20 කින් යුක්තය. නිවැරදි පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 40 කි.
2. පිළිතුරු 04 න් එක් පිළිතුරක් පමණක් තෝරා තිබිය යුතුය.
3. පිළිතුරු 02 ක් හෝ වැඩි ප්‍රමාණයක් තෝරා තිබේ නම් ලකුණු ලබා දීමෙන් වළකින්න.
4. පිළිතුරු කීපයක් තෝරා යම් යම් පිළිතුරු අවලංගු කළ බව තහවුරු කිරීමට ශිෂ්‍යයා උත්සාහ දරා තිබේ නම් (ශිෂ්‍යයාගේ අභිප්‍රාය පැහැදිලි නම්) අවලංගු නොකළ පිළිතුර ශිෂ්‍යයාගේ අභිමතය ලෙස සලකා කටයුතු කරන්න.

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ලකුණු | පිළිතුර ඇතුළත් පිටු අංකය |
|---|---|---|---|
| 01 | II | 02 | 02 |
| 02 | I | 02 | 27 |
| 03 | IV | 02 | 07 |
| 04 | II | 02 | 53 |
| 05 | II | 02 | 76 |
| 06 | III | 02 | 99 |
| 07 | I | 02 | 91 |
| 08 | IV | 02 | 29 |
| 09 | I | 02 | 07 |
| 10 | III | 02 | 16 |

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ලකුණු | පිළිතුර ඇතුළත් පිටු අංකය |
|---|---|---|---|
| 11 | II | 02 | 78 |
| 12 | III | 02 | 19 |
| 13 | I | 02 | 67 |
| 14 | III | 02 | 29 |
| 15 | III | 02 | 27 |
| 16 | II | 02 | 07 |
| 17 | II | 02 | 13 |
| 18 | IV | 02 | 79 |
| 19 | II | 02 | 47 |
| 20 | II | 02 | 77 |

ලකුණු $(20 \times 02) = 40$

II - කොටස

මෙම කොටසේ ප්‍රශ්න 03ක් ඇතුළත්ය. ඉන් ප්‍රශ්න 02කට පමණක් පිළිතුරු සපයා තිබිය යුතුය සෑම ප්‍රශ්නයකටම කොටස් 03ක් ඇත. කොටස් තුනටම පිළිතුරු සපයා තිබිය යුතුය. ප්‍රශ්න 03ටම පිළිතුරු සපයා තිබේ නම් එම පිළිතුරු සියල්ල ඇගයීම් කර ලකුණු ප්‍රදානය කරන්න. අඩුම ලකුණු ප්‍රමාණය ලබා ගත් ප්‍රශ්නයට අදාළ ලකුණු ප්‍රමාණය අවලංගු කර ඉතිරි ප්‍රශ්න 02හි ලකුණු පමණක් වලංගු ලකුණු ලෙස සලකන්න.

ප්‍රශ්න අංක 01 (පිටු අංක 58,59,60,61,62,63)

(I) සද්ධා, ශීල, චාග, පඤ්ඤා යන ගුණාංග හතර දක්වා තිබේ නම් එක ගුණාංගයකට එක ලකුණක් බැගින් ලකුණු 04 ක් දෙන්න. (ලකුණු $(4 \times 01) = 04$)

(II) 1. ධර්මදේශනා පවත්වන ස්ථානවලට කැඳවාගෙන යාම.
2. දහම් පාසල් පෙළපොත මෙන්ම පාසල් පෙළපොත දිනපතා ඔවුනට ඇසෙන සේ කියවීම.
3. සැදැහැවත් උපාසක උපාසිකාවන් ඇසුරු කිරීමට අවස්ථා ලබා දීම.
4. ගුවන් විදුලියේ සහ රූපවාහිනියේ බෞද්ධ වැඩසටහන් ඇසීමට හා නැරඹීමට අවස්ථාව සැලසීම.
5. දෙමව්පියන් සමග දිනපතා සවසට නිවසේදී තෙරුවන් වන්දනා කිරීම.
6. තෙරුවන් වන්දනාවේ යෙදෙන දෙමව්පියන් සඳහා මල්පහන්, ගිලන්පස, වැනි දේ සූදානම් කර දීම.
7. දෙමව්පියන් කැටුව වන්දනා ගමන් යාම.

ඉහත දැක්වෙන ක්‍රියාමාර්ග අතරින් 06ක් ලියා තිබේ නම් එක් ක්‍රියාමාර්ගයකට ලකුණු 01ක් බැගින් උපරිම ලකුණු 06 ක් ලබා දෙන්න. (ලකුණු (6 × 01) =06)

(III) 1. දෙමව්පියන්ගේ එදිනෙදා කටයුතු සඳහා උදව් කිරීම.
2. දෙමව්පියන් සොයා, සපයා දෙන දේ විනාශ නොකර රැක ගැනීම.
3. ගෙදර සහ ගෙදර අවට වටපිටාව පිරිසිදුව හා ලස්සනට තබා ගැනීමට කටයුතු කිරීම.
4. දෙමව්පියන්ගේ ඇඳුම් පැලඳුම් ආදිය සෝදා පිරිසිදු කර දීම.
5. මව්පියන් බොරුවෙන් නොරවටා තමා ඉගෙනීමේ කටයුතු ඕනෑකමින් සිදු කිරීම ආදී දරුවෙකුට කළ හැකි කාර්යයන් 5ක් දක්වා තිබේ නම් ලකුණු 01ක් බැගින් ලකුණු 05ක් දෙන්න.

(ලකුණු (5 × 01) =05)

1. ගුරුවරයා දුටු විට හුනස්නෙන් නැගිට ඔහුට ගරු කිරීම.
2. මැනවින් ඉගෙනීම සහ ගුරු උපදෙස් අනුව ක්‍රියා කිරීම.
3. තමා පිළිබඳ හොඳ ආරංචි ගුරුවරුන්ට ලැබෙන ආකාරයට ක්‍රියා කිරීම.
4. නිසි දිනට, නිසි වෙලාවට දෙන ලද අභ්‍යාස ආදිය නිම කිරීම.
5. ගුරුතුමා සේවයෙන් ඉවත්ව සිටියද, ඔහු බැලීමට යාම සහ අවවාද අනුශාසනා ලබා ගැනීම ආදී දරුවෙකුට කළ හැකි කාර්යයන් 5ක් දක්වා තිබේ නම් ලකුණු 01ක් බැගින් ලකුණු 05 ක් දෙන්න.

(ලකුණු (5 × 01) =05)

ප්‍රශ්න අංක 02 (පිටු අංක 83,84,85)

(I) හිඳීම, සිටීම, ගමන් කිරීම, නිදා සිටීම යනුවෙන් ඉරියව් 04 දක්වා තිබේ නම්, ලකුණු 01 බැගින් මුළු ලකුණු 04ක් දෙන්න. (ලකුණු (4 × 01) =04)

(II) සුවසේ නිදයි, සුවසේ අවදිවෙයි, නපුරු සිහින නොපෙනෙයි, මිනිසුන්ට ප්‍රිය වෙයි, මිනිසුන් නොවන අයටද ප්‍රිය වෙයි, දෙවිවරු විසින් ආරක්ෂා කරයි, විපත්වලින් වළක්වාලයි, වහා සිත සමාධිගත වෙයි, මුහුණ ප්‍රසන්න වෙයි, සිහි ඇතිව මරණයට පත්වෙයි, රහත්වී නොමැති නම් බ්‍රහ්ම ලෝකයේ උපදී.

මෙම කරුණු 11න් 06ක් දක්වා තිබේ නම් එක් පිළිතුරකට ලකුණු 01 බැගින්ලකුණු 06ක් දෙන්න.

(ලකුණු (6 × 01) =06)

(III) මෙම කොටසට පිළිතුරු ශිෂ්‍යයාගේ අත්දැකීම් මගින් ලියා තිබිය යුතුය. මිතුරුකම නිසා තමන්ට ලැබෙන ප්‍රයෝජන 05ක් සහ මිතුරන්ට ලැබෙන ප්‍රයෝජන 05 ක් වෙන් වෙන් වශයෙන් ලියා තිබිය යුතුය. එක් ප්‍රයෝජනයක් සඳහා ලකුණු 01 බැගින් උපරිමය ලකුණු 10 ක් ලබා දෙන්න. පිළිතුරු සිසුවාගේ වයස් මට්ටමට ගැළපෙන පරිදි සකස් වී තිබිය යුතුය. (ලකුණු (10 × 01) =10)

ප්‍රශ්න අංක 03 (පිටු අංක 101,102,103,104,105)

(I) මල් නටුව එකම අතට සිටින සේ ගෙතූ මල්දම්
දෙපසට මල් නටු සිටින සේ ගෙතූ මල්දම්
මල් කිනිති සේ සකස් කළ මල්දම්
නූලක හෝ ඉරටු වැනි කූරක අමුණන ලද මල්දම්
මල් මාලා කිහිපයක් එකට බැඳ සකස් කළ මල්දම් මුතුහරක් සේ ළයෙහි පැලඳිය හැකි ආකාරයට සකස් කළ මල්දම්
කන මතුයෙහි පලඳිනු පිණිස සකස් කළ මල්දම්
මේ ආකාර 07න් 04 ක් ලියා ඇත් නම් එක් ලකුණක් බැගින් ලකුණු 04ක් ලබා දෙන්න.
(ලකුණු (4 X 01) =04)

(II) බුද්ධ පූජාවට, බෝධි පූජාවට අවශ්‍ය මල් පලතුරු, බෙහෙත් ආදිය සපයා ගැනීමට හැකි වීම.
නිවසේ ආලින්දය මල් වලින් සැරසීමට හැකි වීම.
මල්, පලතුරු ඔසු පැල ආදිය අන් යට පරිත්‍යාග කර සතුටු වීමට හැකි වීම.
මල් පැණි බොන, ඉදුණු පලතුරු රස විඳින විවිධ සතුන් දෙස බලා සතුටක්, ප්‍රීතියක් ලබා ගත හැකි වීම.
ගිලනුන්ට පලතුරු සහ ඖෂධීය කැඳවලින් සංග්‍රහ කිරීමට හැකි වීම.
වඳවී යන මල්, පලතුරු ඖෂධ වර්ග රැක ගැනීම තුළින් අනාගතය සඳහා ඒවා ආරක්ෂා කර තැබීමට හැකි වීම.
මෙම ප්‍රයෝජන අතරින් 06ක් ලියා තිබේ නම් ලකුණු 01 බැගින් ලකුණු 06ක් ලබා දෙන්න.
(ලකුණු (6 X 01) =06)

(III) සිරුර පැහැපත් වේ
උවදුරු දුරු වෙයි.
නිරෝගී සම්පත් ලැබේ.
ආයු වර්ණ, සැප, බල නුවණ ලැබේ.
පිරිස් බලය වැඩිවේ.
සාගින්න, පිපාසය සන්සිඳෙයි.
ආමාශය පිරිසිදු වෙයි.
කායික, මානසික, වාචික සංවරය ඇතිවේ.
නිරාමිස ප්‍රීතිය ඇතිවේ.
ගරු බුහුමන් ලැබේ.
කීර්තියට හා ප්‍රසංශාවට ලක්වේ.
ප්‍රියමනාප පුද්ගලයෙක් වෙයි.
දෙව්, මිනිස් සැප ලැබේ.
මෙම ආනිසංස අතරින් 10ක් ලියා තිබේ නම් ලකුණු 01 බැගින් ලකුණු 10ක් ලබා දෙන්න.
(ලකුණු (10 X 01) =10)

## III - කොටස

මෙම කොටසේ ප්‍රශ්න 02 ක් ඇතුළත්ය. සෑම ප්‍රශ්නයකටම කොටස් දෙකක් ඇත. එම ප්‍රශ්න දෙකටම පිළිතුරු සපයා තිබීම අනිවාර්යය වේ.

ප්‍රශ්න අංක 01

(I) පූජේමි බුද්ධං කුසුමේනනේන
පුඤ්ඤේන මේතේන ලභාමි මොක්ඛං
පුප්ඵං මිලායාති යථා ඉදං මේ
කායෝ තථායාති විනාස භාවං

යනුවෙන් නිවැරදි අක්ෂර වින්‍යාසය සහිතව ගාථාව සම්පූර්ණ කර තිබේ නම් සම්පූර්ණ ලකුණු 05 ම ලබා දෙන්න.අක්ෂර වින්‍යාසය සහ පද බෙදීමේ දුර්වලතා තිබේ නම් සම්පූර්ණ ලකුණු වෙනුවට ප්‍රමාණවත් ලකුණු ප්‍රමාණයක් ලබා දෙන්න. (ලකුණු 05)

(II) "මෙම මල් රැස බුදුරදුන්ට පූජා කරමි. එයින් ලැබෙන්නාවූ පිනෙන් මෝක්ෂය ලබමි.මල් පරවී යන්නේ යම්සේද මාගේ කය ද විනාශයට පැමිණේ" මෙම අදහස ප්‍රකට වන පරිදි අර්ථය ලියා තිබේ නම් සම්පූර්ණ ලකුණු 05 ම ලබා දෙන්න. (ලකුණු 05)

ලකුණු (5+5) =10)

ප්‍රශ්න අංක 02 (පිටු අංක 59)

(I) යෝච පුබ්බේ පමජ්ජිත්වා
පච්ඡා සෝ නප්පමජ්ජති
සෝ ඉමං ලෝකං පභාසේති
අබ්භා මුත්තොව චන්දිමා

යනුවෙන් නිවැරදි අක්ෂර වින්‍යාසය සහිතව ගාථාව සම්පූර්ණ කර තිබේ නම් සම්පූර්ණ ලකුණු 05 ම ලබා දෙන්න.අක්ෂර වින්‍යාසය සහ පද බෙදීමේ දුර්වලතා තිබේ නම් සම්පූර්ණ ලකුණු වෙනුවට ප්‍රමාණවත් ලකුණු ප්‍රමාණයක් ලබා දෙන්න. (ලකුණු 05)

(II) ''යමෙක් පෙර කලදී ප්‍රමාදිතව ක්‍රියා කර, පසුව අප්‍රමාදී බවෙන් යුතුව කටයුතු කරයි නම් හෙතෙම වලාකුළෙන් මිදුණු සඳක් සේ ලෝකයේ බබළන්නේය'' මෙම අදහස ප්‍රකට වන පරිදි අර්ථය ලියා තිබේ නම් සම්පූර්ණ ලකුණු 05ම ලබා දෙන්න. (ලකුණු 05)

ලකුණු (5+5) =10)